# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1983/38 – 2016 සැප්තැම්බර් 09 වැනි සිකුරාදා – 2016.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/06/2008.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2009.04.27 වැනි දින අංක 1599/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2009.04.20 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. කේ. ශාන්ත සේනාරත්න මයා, අංක 990/07, ශ්‍රී සුමංගල මාවත, අළුවිහාරය, මාතලේ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර පවත්නා 2009.03.31 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එම්. ආරිෆ් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2009.04.20 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

09 – 925/1

1A – G 24189 – 102 (2016/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/22/06/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. කේ. ශාන්ත සේනාරත්න මයා, අංක 990/07, ශ්‍රී සුමංගල මාවත, අළුවිහාරය, මාතලේ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160 හි කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: : IR/22/06/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. කේ. ශාන්ත සේනාරත්න මයා, අංක 990/07, ශ්‍රී සුමංගල මාවත, අළුවිහාරය, මාතලේ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

01. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2001.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි V වන ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරට පත් කරනු ලැබූ ඩී. කේ. ශාන්ත සේනාරත්න මහතා 1996.01.26 වැනි දින සිට එම තනතුරෙහි වැඩ බැලීම සැලකිල්ලට ගෙන, එම තනතුර 1996.01.26 දිනට පෙරදාතම කිරීම සඳහා ඔහු හිමිකම් ලබන්නේ ද ? යන්න හා

02. එලෙස හිමිකම් ලබන්නේ නම්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2006 වර්ෂයේදී IV වන ශ්‍රේණියේ කළමනාකාර තනතුරට උසස්වීම් ලබාදීම සඳහා සම්මුඛ පරීක්ෂණවලට කැඳවීමේදී ඩී. කේ. ශාන්ත සේනාරත්න මහතාගේ V වන ශ්‍රේණියේ සේවා කාලය 1996.01.26 වැනි දින සිට

ගණනය කළ යුතු වන්නේ ද යන්න හා එලෙස ගණනය කිරීම සඳහා හිමිකම් ලබන්නේ නම්, ඒ අනුව ඔහුට ලැබිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව ද වේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 – 925/2

---

මගේ අංකය: IR/10/89/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ගුණපාල මයා, අංක 37, නව නීග්‍රෝධාරාම පාර, කළුතර උතුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිලියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89එෆ් හි සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/89/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ගුණපාල මයා, අංක 37, නව නීග්‍රෝධාරාම පාර, කළුතර උතුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි අධිකාරිවරයෙකු ලෙස සේවය කළ එම්. ගුණපාල මහතාට විශ්‍රාම වැටුප් හිමිකම් ලබා නොදීමෙන් අගතියක් සිදු වී ඇති බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජුනි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 – 926

---

මගේ අංකය: IR/15/43/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2013.03.01 වැනි දින අංක 1799/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.02.18 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන විලේජ්, රජවැල්ල, දිගන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තැප්‍රෝබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 50, රජ මාවත, ඇතුල් කෝට්ටේ පාර, නුගේගොඩ.

අතර පවත්නා 2013.01.31 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සුනෙත් ලොකුබෝගහවත්ත මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2013.02.18 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

09 – 927/1

---

මගේ අංකය: IR/15/43/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන නිලගම, දිගන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තැප්‍රෝබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 50, රජ මාවත, ඇතුල් කෝට්ටේ පාර, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්ත්‍රිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128 හි එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: : IR/15/43/2010.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. එච්. පතිරණ මයා, අංක 207, වැලි පාර, දිගන නිලගම, දිගන.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තැප්‍රෝබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 50, රජ මාවත, ඇතුල් කෝට්ටේ පාර, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ** –

තැප්‍රෝබේන් ස්ටුඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ලද ඩී. එච්. පතිරණ මහතාට 2007 ඔක්තෝබර් මස සිට 2009 සැප්තැම්බර් මස දක්වා එකඟ වූ වැටුප් හා දීමනා ලබා නොදීම යුක්ති සහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඔහුට කුමන සහනයන් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජූලි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 - 927/2

---

මගේ අංකය: : IR/10/47/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. නිමල් රණතුංග මයා, කුමාර කඩේ බාරේ, හීන් ඇලපිටිය පාර, යෝගම, දෙහිඕවිට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, අබේරත්න මාවත, අංක 28 හි එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: : IR/10/47/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. නිමල් රණතුංග මයා, කුමාර කඩේ බාරේ, හීන් ඇලපිටිය පාර, යෝගම, දෙහිඕවිට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන අයි. නිමල් රණතුංග මහතාට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/95 අනුව නැවත සේවයේ පිහිටුවීමේ දී සේවය නොකළ කාලයට හිඟ වැටුප් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී ඇත් ද යන්න හා එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජූලි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 - 928

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.